# පුංචි නරක රෝස මල



මිහිදිනී උමායා සේනානායක

# පුංචි තරක රෝස මල

## මිහිදිනී උමායා සේනානායක

කතෘගේ වෙනත් කෘති “අපේ පුංචි සමනලී”

මහමායා බාලිකා විදුහල, මහනුවර

3 වසර B

**ISBN 978-624-208-276-9**

චිත්‍ර

මිහිදිනී උමායා සේනානායක

ඩිජිටල් චිත්‍ර සංස්කරණය හා පිටු සැකස්ම

අංජන සේනානායක

ප්‍රථම ඩිජිටල් පළ කිරීම 2025

විමසීම් සඳහා anjanasenanayake@gmail.com

## පිදුම

මට සැමදා ආදරය කරන

අම්මා, තාත්තා, සීයලා, ආච්චි, මාමලා, නැන්දලා,

රවිඳු හා සෙනුක මල්ලිලා ද,

අප අතර නැති උනත් ආදර අත්තම්මා ඇතුළු

පවුලේ සැමටත්

ලස්සනට අත් අකුරු ලියන්න, කියවන්න කියාදුන්

තමිලා හා චම්පිකා ගුරු මෑණිවරුන්ටත්

මාගේ දෙවන නිර්මාණය වන

"පුංචි නරක රෝස මල"

කතාව බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ , දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රාජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර .

1

එකෝමත් එක රටක හිටියා

නරක රෝස මලක්.

ඒ පුංචි රෝස මල එයාගේ


යහළුවන්ට බැන්නා,කරදර

කළා.



එයාගේ යහළුවෝ හරිම හොඳයි.

ඒ පුංචි රෝස මල එයාගේ
යහළුවන්ට කරදර කරනවා.
තල්ලු කරනවා.



5

"අනේ අපිට බනින්න එපා."

පුංචි මල් ඔක්කොම කෑගැහුවා.



"අපි ඒ පුංචි රෝස මලට පාඩමක් උගන්නමු".

පුංචි කහ මල කිව්වා.

"ඒකනම් හොඳයි තැඹිලි මල කිව්වා".

"අපි එයාගේ නටුව කපමු".

ටිකක් දවස් යද්දි රෝස මලේ නටුව කැපුවා.






පුංචි රෝස මල මැලවිලා යන්න ගියා.

"අනේ යහළුවනේ, මට උදව් කරන්නකෝ".

රෝස මල ඇඬුවා.

"හැබැයි ඔයා අපිට ගොඩක් කරදර කළා", කහ මල කිව්වා.




"ඒකට ඉස්සෙල්ලාම සමාව ඉල්ලන්න ඕනෑ" තැඹිලි මල කිව්වා.

"අනේ යහළුවනේ සමාවෙන්න" රෝස මල කිව්වා.

"හරි එහෙනම් අපි ඔයාට උදව් කරන්නම්".

"ගොඩාක් ස්තුතියි" පුංචි රෝස මල කිව්වා.



කතාව අවසන්.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කාලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය , දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනායාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදීකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ , සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.